**බුද්ධශාසන, ආගමික හා**

**සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

# ටවර් හෝල් රඟහල පදනම

# පුරප්පාඩු - දැන්වීම

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ටවර් හෝල් රඟහල පදනමේ පුරප්පාඩු වී ඇති පහත දක්වා ඇති තනතුරු සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුරු සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇති ස්ථිර තනතුරු වේ.

## කළමනාකරණ සේවා ගණය :- (MM 1-1)

## 01. සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) II ශ්‍රේණිය - තනතුරු සංඛ්‍යාව - 01

**තනතුරට අදාළ කාර්යයන්**

ආයතනයේ මූල්‍ය කටයුතු හා ගිණුම්කරණය පිළිබඳ ප්‍රධාන වගකීම දැරීම.

**බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කළමනාකරණය / වාණිජ්‍යය/ ගණකාධිකරණය පිළිබඳ උපාධියක් හෝ පිළිගත් වරලත් ගණකාධිකාරී ආයතනයක ICASL/ACA/ICMA/ACCA අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ ගිණුම් කටයුතු පිළිබඳව වසරක පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත සඳහන් 1 හෝ 2)**

1 ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

2. කනිෂ්ඨ කළමනාකාර (JM) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වෙනත් සුදුසුකම්**

පරිගණක භාවිතය සහ ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව තිබිය යුතුය.

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පී ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම.

**වැටුප** : රු. 53,175-1,375 X10-1,910X 15 = 95,575/-

**වයස** : අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

**මෙම තනතුරට හිමිවන වරප්‍රසාද**

- ✦ භාණ්ඩාගාරය විසින් අනුමත ජීවන වියදම් දීමනාව හා වෘත්තීය දීමනාව ඇතුළු අනෙකුත් සියලු දීමනාවන්
- ✦ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 02/2022 අනුව දුරකථන දීමනාව
- ✦ ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ

## 02. ප්‍රාථමික ශිල්පීය සේවා ගණය - PL-3

## රංගාලෝක ශිල්පී III ශ්‍රේණිය - තනතුරු සංඛ්‍යාව - 01

**තනතුරට අදාළ කාර්යයන්**

නිර්මාණශීලී රංගාලෝකකරණය හා ඊට අදාළ කටයුතු

**සුදුසුකම් - බාහිර අයදුම්කරුවන් සඳහා**

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයන් හයකින් (06) කින් සමත්වීම.

රංගාලෝක ශිල්පී අදාළ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා NVQ 4 වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සුදුසුකම් - අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහක (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් /වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ රංගාලෝක ශිල්පී තනතුරේ කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) සිව්වැනි (04) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වන ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL – 2 ) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL – 1) සේවා ගණයක සේවකයින්

හෝ

රංගාලෝක ශිල්පී තනතුරේ කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**වැටුප් පරිමාණය** : රු. 26,290 -10 X 270 - 10 X 300- 10 X 330- 12 X350 = 39,490/-

: ආකර්ෂණීය වෛද්‍යරක්ෂණ ආවරණයක් හිමි වේ.

**වයස** : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය.

(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

## 03. ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය - PL-2

## රංගාලෝක ශිල්පී සහායක III ශ්‍රේණිය - තනතුරු සංඛ්‍යාව - 01

**තනතුරට අදාළ කාර්යයන්**

රංගාලෝකකරණය සඳහා සහාය වීම.

**සුදුසුකම් - බාහිර අයදුම්කරුවන් සඳහා**

රංගාලෝක ශිල්පී සහායක තනතුරෙහි කාර්යභාරයට අදාළ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා NVQ 2 මට්ටමට නොඅඩු මට්ටමක රංගාලෝක ශිල්පය පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සුදුසුකම් - අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

01 අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් /වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන වෘත්තීය පරීක්ෂණයක Trade Test දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතා NVQ 2 වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL – 1) සේවා ගණයක සේවකයින්

02 රංගාලෝක ශිල්පී සහායක කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා NVQ 2 වැනි මට්ටමට නොඅඩු මට්ටමක රංගාලෝක ශිල්පය පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**වැටුප් පරිමාණය** : රු.25,750-10 X 270 -10 X300- 10 X 330-12X 350 = 38,950/-

: ආකර්ෂණීය වෛද්‍ය රක්ෂණ ආවරණයක් හිමි වේ.

**වයස** : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය.

(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

**වෙනත් තොරතුරු**

- ✦ සේවක අර්ථ සාධක අරමුදල සඳහා - සේව්‍යයාගේ දායකත්වය 15%

  සේවකයාගේ දායකත්වය 10%
- ✦ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා සේව්‍යයාගේ දායකත්වය 3%
- ✦ රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවය කරනු ලබන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**සෑම ඉල්ලුම්කරුවෙක් ම,**

- ✦ ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
- ✦ තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- ✦ විශිෂ්ට චරිතයකින් හෙබිවිය යුතු ය.
- ✦ බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමෙන් පසු වසර 03 ක පරිවාස කාලයකට යටත්ය. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමෙන් පසු වසරක වැඩබැලීමේ කාලයකට යටත් ය.

ඉහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම සුදුසුකම් තහවුරු කෙරෙන සහතික වල පිටපත් සමඟ අයදුම්කරු විසින් සකස් කරන ලද අයදුම්පත් 2024-07-29 දිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තමා ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවය කරනු ලබන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**

**ටවර් හෝල් රඟහල පදනම**

**සවිසිරිපාය, අංක 123,විජේරාම මාවත, කොළඹ 07.**

2024-07-15